සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019**

# Third Term Test - Grade 8 - 2019

නම : ............................................... **ක්‍රිස්තියානි ධර්මය** කාලය : පැය 02 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ලබා දී ඇති ප්‍රශ්නවලට ගැළපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

## I කොටස

(1) ආබ්‍රහම් උපන් නගරය වන්නේ,

1. හාරාත් ය. 2. කානාත් ය. 3. ඌර් ය. 4. මිදියන් ය.

(2) පංච පුස්තකයට අයත් පොතක් නොවන්නේ,

1. ජෙරමියා ය. 2. උත්පත්ති ය. 3. නික්මයාම ය. 4. ගණන් කතාව ය.

(3) ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් අතර සිටි අයකැමියා වූයේ,

1. ලෙවී ය. 2. සාකෙවුස් ය. 3. බර්තොලමෙව් ය. 4. ජුදස් ය.

(4) ජේසුස් වහන්සේ කුරුසගසේ සිටියදී තම මෑණියන් බාර කළේ,

1. ජාකොබ්තුමාට ය. 2. ස්නාවක ජොහන්තුමාට ය.
3. සීමොන්තුමාට ය. 4. ජොහන් තුමාට ය.

(5) ''මෙන්න මාගේ පණිවුඩය නුඹේ මුඛයෙහි තැබීමි.'' මෙහි සඳහන් වන්නේ කා ගැන ද?

1. ජෙරමියා දිවැසිවරයා ගැන ය. 2. යෙසායා දිවැසිවරයා ගැන ය.
3. ආමෝස් දිවැසිවරයා ගැන ය. 4. එසකියෙල් දිවැසිවරයා ගැන ය.

(6) අප විසින් ප්‍රගුණ කළ යුතු දේවරාජ්‍යයේ වටිනාකමක් නොවන්නේ,

1. පරිත්‍යාගය යි. 2. සමානාත්මතාවය යි. 3. ආරක්ෂාව යි. 4. ප්‍රේමය යි.

(7) ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුරජාණෝ'' මෙලෙස පැවසූ ගෝලයා වන්නේ,

1. ජාකොබ් ය. 2. පේදුරු ය. 3. ජොහාන් ය. 4. මතෙව් ය.

(8) දෙවියන් වහන්සේට යටත්ව අවනතව ජීවත් වනු වෙනුවට උන්වහන්සේට සමාන වන්නට ආශා කළේ,

1. දාවිත් සහ නෝවා ය. 2. ආබ්‍රහම් සහ සාරා ය.
3. අම්රාම් සහ ජොකෙබෙද් ය. 4. ආදම් සහ ඒව ය.

(9) ඊශ්‍රායෙල් ජනතාවගේ සහය ඇතිව නෙහෙමියා පවුර ගොඩනැගීමට ගත් දින ගණන

1. දින 50කි. 2. දින 51කි. 3. දින 52කි. 4. දින 53කි.

(10) ''බිය නොවන්න ඇදහිල්ලෙන් ම සිටින්න. ඇය සුව වනු ඇත.'' මෙවදන් ජේසුතුමා පැවසුවේ,

1. සායිරස්ගේ දියණිය ගැන ය.
2. මී මැස්මොර රෝගියා ගැන ය.
3. පේදුරුගේ නැන්දනිය ගැන ය.
4. වැන්දඹු ස්ත්‍රියගේ පුත්‍රයා ගැන ය.

(11) ''හඬක්'' නොමැති අසරණ අයෙකුගේ හඬ බවට පත් වූයේ කුමන රෝගය සම්බන්ධව ද?

1. කුෂ්ඨ රෝගය.
2. ලාදුරු රෝගය.
3. අන්ධ රෝගය.
4. ගොළු බිහිරි රෝගය.

(12) දුගී දුප්පත් ජනතාවට රැකවරණය සලසන ''ක්‍රිස්තව සේවා ආශ්‍රම්'' නම් ස්ථානය ලබා දුන්නේ,

1. ගරු මයිකල් රොද්‍රිගු පියතුමා.
2. සේවක සැමුවෙල් සෙල්වරත්නම්.
3. කුමාරදාස් පෙරේරා දේවගැතිගුමා.
4. ඩොනල්ඩ් කනගරත්නම්තුමා.

(13) පංච පුස්තකයෙහි සඳහන් කර්තෘ සහ උප කර්තෘ වන්නේ,

1. දෙවියන් වහන්සේ සහ යේසුස් වහන්සේ.
2. දෙවියන් වහන්සේ සහ මිනිසා.
3. යේසුස් වහන්සේ සහ මිනිසා.
4. දෙවියන් වහන්සේ සහ ආබ්‍රහම් ය.

(14) ''විලුඹ ඩැහැගත්තා'' යන අර්ථය හිමි වූයේ කාට ද?

1. ඊසාක්ට ය.
2. ඒසව්ට ය.
3. ජාකොබ්ට ය.
4. ජෝසප්ට ය.

(15) අතිගරු ඇන්ඩෘ කුමාරගේ හිමිපාණෝ බිෂොප්තුමා බවට පත් වූයේ,

1. 1954 වර්ෂයේ දී ය.
2. 1983 වර්ෂයේ දී ය.
3. 1950 වර්ෂයේ දී ය.
4. 1982 වර්ෂයේ දී ය.

(16) ඊශ්‍රායෙල් ජනතාව අවසාන කාලයේ දී විප්‍රවාසගතව සිටියේ,

1. රෝම අධිරාජ්‍යය යටතේ ය.
2. පර්සියානු අධිරාජ්‍යය යටතේ ය.
3. සීසර් අධිරාජයා යටතේ ය.
4. බැබිලෝනියා අධිරාජ්‍යය යටතේ ය.

(17) ඊශ්‍රායෙල් නායකයන්ගේ ක්‍රියාකාරීත්වය සමාන කළේ,

1. දැල්වෙන පහනකට ය.
2. ලුණු කණුවකට ය.
3. දැල්වෙන ගිනි පුපුරකට ය.
4. සැඬ සුළඟකට ය.

(18) ''දරුවා බාල වියේදී ම යහමඟ යවන්න. එවිට ඔහු මහලු වියේදීත් ඉන් ඉවත්ව නොයයි.'' මෙය සඳහන් බයිබල් පාඨය වන්නේ,

1. යෙසායා 26:2
2. ගීතාවලිය 150:3
3. හිතෝපදේශය 22:6
4. කොරෙන්ති 13:4

(19) හින්දු භක්තිකයන්ගේ පූජනීය ග්‍රන්ථය වන්නේ,

1. ත්‍රිපිටකය.
2. අල් කුරානය.
3. වේද ග්‍රන්ථය.
4. ශු. බයිබලය.

20) කිතුනු දරුවෙකු ලෙස සැමවිට ඔබට විරුද්ධව ක්‍රියා කරන අය වෙනුවෙන් ඔබ කළ යුතු කාර්යක් වන්නේ,

1. අගය කිරීම යි.
2. සමාව දීම යි.
3. හිංසා කිරීම යි.
4. වෛර කිරීම යි.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) ''එප්පාතා'' යන්නෙහි අරුත ලියන්න.
(ii) ශු. බයිබලය කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය ලෙස හඳුන්වන්නේ කුමක් නිසා ද?
(iii) ආබ්‍රහම්ගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ 02ක් ලියන්න.
(iv) කුළුඳුල් බවේ ආශිර්වාදය සොරා ගත්තේ කවුරුන් ද?
(v) දිවසිවරියක හා විනිශ්චයකාරියක වූයේ කවරෙක් ද?
(vi) ජේසුස් වහන්සේගේ මෙහෙවර ආරම්භ කිරීමට පසුබිම සකස් කළේ කවරෙක් ද?
(vii) තිබේරියස් මුහුද හඳුන්වන තවත් නමක් ලියන්න.
(viii) ''යාච්ඤාවේ ගුරුවරිය'' ලෙස විරුදාවලිය ලැබුවේ කවුරුන් ද?
(ix) ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් අපට දී තිබෙන දීමනා 02 ලියන්න.
(x) දොළොස්දෙනාගේ ධර්මදූත සේවය සඳහා යාමේ දී රැගෙන නොයන ලෙස පැවසුවේ මොනවා ද?

(ලකුණු $2 \times 10 = 20$)

(2) 1. ආදි පියවරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)
2. ආදි පියවරුන්ගේ ජීවිත තුළින් හඳුනාගත හැකි පොදු ලක්ෂණ 03ක් ලියන්න. (ලකුණු 03)
3. ඔබට පැමිණෙන අභියෝග 03ක් නම් කර ඒවා ජයගත හැකි ආකාර ලියන්න. ලකුණු 05)

(3) 1. ජේසුස් වහන්සේ තුළින් සුවය ලැබූ බයිබලයේ සඳහන් රෝගීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)
2. එම එක් රෝගියෙකු සුවකළ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 03)
3. අසනීප වී සිටින ඔබේ මිතුරකු වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ලකුණු 05)

(4) 1. දිවසිරු යනු කවුරුන් ද? (ලකුණු 02)
2. ජෙරමියා දිවැසිවරයා දුටු දර්ශන 02ක් ලියා දක්වන්න. (ලකුණු 03)
3. අද සමාජය තුළ ඔබ දකින අයහපත් ක්‍රියා 03ක් නම් කර ඒවා ජයගත හැකි ආකාර ලියන්න. (ලකුණු 05)

(5) හිමිහට සේවය නම් - අනුනට සේවයමයි
සදා දිවිය ඔවුනට හිමි බැව් - ජේසුස් හිමි පවසයි.
1. ඉහත කවි පදයට අනුව කිතුනු අපගේ ජීවිත කෙලෙස විය යුතු ද? (ලකුණු 02)
2. තම ජීවිත කැපවීම තුළ ශ්‍රී ලාංකික ජන සමාජයට මහත් මෙහෙයක් ඉටු කළ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
3. කිතුනු දරුවෙකු ලෙස පීඩාවට පත් වූ අයෙකු වෙනුවෙන් ඔබට කළ හැකි උපකාර 03ක් ලියන්න. (ලකුණු 05)

(6) 1. ජේසුතුමා තම ගෝල පේදුරුට දුන් වගකීම කුමක් ද? (ලකුණු 02)
2. දේව සේවය සඳහා කැඳවීම් ලබන අය තුළ තිබිය යුතු ගුණාංග 03ක් නම් කරන්න. (ලකුණු 03)
3. ඔබට දේව කැඳවීම ලැබුණහොත් ඔබ ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Ans

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

ක්‍රිස්තියානි ධර්මය - පිළිතුරු

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (6) | 3 | (11) | 4 | (16) | 4 |
| (2) | 1 | (7) | 2 | (12) | 2 | (17) | 1 |
| (3) | 2 | (8) | 4 | (13) | 2 | (18) | 3 |
| (4) | 4 | (9) | 3 | (14) | 3 | (19) | 3 |
| (5) | 1 | (10) | 1 | (15) | 1 | (20) | 2 |

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

(1) (i) ඇරේවා

(ii) දේවාත්මානුභාවයෙන් රචිත නිසා

(iii) ඇදහිල්ල හා කීකරුකම

(iv) ජාකොබ්

(v) දෙබෝරා

(vi) ස්නාවක ජොහන්තුමා

(vii) ගලීලයේ මුහුද / ගෙනසරත් විල

(viii) එලීෂා ඇග්නිච්

(ix) දිවැස්වැකි පැවසීමේ බලය

ආත්ම විමසීමේ හැකියාව

අන්‍ය භාෂා කතා කිරීමේ බලය

(x) මල්ලක්වත් / කමිස දෙකක්වත් / පාවහන් සැරයටියක්

(ලකුණු 02 × 10 = 20)

(2) 1. ආබ්‍රහම්/ ජාකොබ්/ ඊසාක් (ලකුණු 02)

2. ඇදහිල්ල/ කීකරුකම/ සමාව දීම (ලකුණු 03)

3. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 05)

(3) 1. ලාදුරු රෝගය/ අන්ධ රෝගියා (ලකුණු 02)

2. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 03)

3. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 05)

(4) 1. දෙවියන් වහන්සේගේ පණිවිඩය ජනතාව ඉදිරියේ ප්‍රකාශ කරන තැනැත්තා (ලකුණු 02)

2. කලින් පිබිදෙන කොට්ටම්බා ගසක්

උතුරු දෙසින් මේ දෙසට කට ඇරී උතුරන සැලියක් (ලකුණු 03)

3. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 05)

(5) 1. අන් අයට සේවය කිරීම. (ලකුණු 02)

2. ගරු මයිකල් රොද්‍රිගු පියතුමා

සේවක සැමුවෙල් සෙල්වරත්නම්තුමා (ලකුණු 03)

3. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 05)

(6) 1. මාගේ බැටළුවන් පෝෂණය කරන්න. (ලකුණු 02)

2. නිහතමානීකම (ලකුණු 03)

කීකරුකම

අවංකකම

3. ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ලකුණු 05)